# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1299/6 - 2003 ජූලි 29 වැනි අඟහරුවාදා - 2003.07.29

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී. 3/82(11).

**1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත**

1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 53 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සාදන ලද රීති.

සභාපති,
ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව.

2003 ක්වූ ජූලි මස 25 වැනි දින,
කොළඹ දී ය.

රීතිය

1995 ජූනි 16 වැනි දින අංක 875/9 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද සමාගම් අත්කර ගැනීම් හා ඒකාබද්ධවීම් රීති සංග්‍රහයේ 31 වන රීතියේ (1) වන ඡේදයට ඉක්බිතිවම (18) සහ (1ආ) යන ඡේද වශයෙන් බලාත්මක විය යුතු පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීම මගින් එම රීතිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1ආ) (1) අර්පණය ව්‍යාප්ති කරන්නේ හෝ කරනු ලැබිය යුත්තේ කවර කොටස් හිමියන් වෙත ද ඒ සියලු කොටස් හිමියන් වෙත අර්පණය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම පිණිස ප්‍රමාණවත් මූල්‍ය සම්පත් අර්පණය කරන තැනැත්තාට ඇත්තේ නම් මිස, කිසිදු තැනැත්තකු විසින් මේ රීතිය යටතේ අර්පණයක් කිරීම සඳහා බැදීමක් නොදැරිය යුතු ය.

(2) මේ රීතියේ 1 වන උපඡේදයෙහි සඳහන් යම් තැනැත්තකුට අර්පණය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වන්නේ නම් හෝ එසේ කිරීමට නොහැකි බව කොමිෂන් සභාවේ මතය අනුව පෙනී යන්නේ නම් හෝ අර්පණයක් කිරීමට මේ රීතිය යටතේ තම වගකීම එම තැනැත්තා විසින් මඟ හැරීම සඳහා අවශ්‍ය කොටස් ප්‍රමාණය අත්හැර දමන ලෙස එම තැනැත්තාට විධාන කිරීමේ බලය කොමිෂන් සභාවට ඇත්තේ ය.

(1ආ) (1) මේ රීතිය අනුව අර්පණයක් කිරීමට බැදීමක් ඇති යම් තැනැත්තකු විසින්, මේ රීතියේ නියමයන් පරිදි එවැනි අර්පණයක් සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමට තමාට ඇති හැකියාව පිළිබඳව කොමිෂන් සභාව සෑහීමට පත්වන පරිදි, තහවුරු කිරීමේ ලියකියවිලි ද සමග දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු ය.

(2) ඉහත කී දිවුරුම් ප්‍රකාශය, අර්පණයක් කිරීමට පිණිස බැදීමක් ඇතිවීමෙන් පසුව හෝ එවැනි අර්පණයක් කරන ලෙස කොමිෂන් සභාව විසින් නියම කිරීමෙන් පසු වෙළඳපොළ දින 3 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු ය.

08-640

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි.